# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,780/20 — 2012 ඔක්තෝබර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 289 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද මහ නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 10 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

01. මෙම නියෝග මහ නගර සභාවේ නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට, සභිකයින්ට ගමන් වියදම් ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

02. මහ නගර සභාවක නගරාධිපතිවරයෙකුට, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකුට හෝ සභිකයෙකුට සභාව මගින් පවරනු ලබන රාජකාරි කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූරණය කිරීමක් වශයෙන් පහත සඳහන් පරිදි කිලෝ මීටරයකට ගාස්තුවක් ගෙවනු ලැබිය හැකිය.

| | | |
|---|---|---|
| (i) | මෝටර් රථයක්/ත්‍රිරෝද රථයක් සඳහා කිලෝ මීටරයකට | රු. 10.00 |
| (ii) | යතුරු පැදියක් සඳහා කිලෝ මීටරයකට | රු. 4.00 |


1A - PG 001405 — 630 (2012/10)

(iii). පොදු වාහන සඳහා වන අවස්ථාවන්හි දී සත්‍ය වශයෙන් ඒ සඳහා ගෙවනු ලැබූ මුදල

03. රාජකාරි කාර්යයන් සඳහා යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම් පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය සේ සලකා කටයුතු කළ හැකිය.

අදාළ මෝටර් රථයේ /ත්‍රි රෝද රථයේ හෝ යතුරු පැදියේ,

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගෙවනු ලබන ගමන් වියදම්වල එකතුව නගරාධිපතිවරයෙකු/නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ සභිකයකු සඳහා මසකට රු. 3,000.00ක උපරිමයකට යටත් විය යුතු ය.

05. ඉහත පරිදි ගමන් වියදම් ගෙවීමේ දී සිදු කරනු ලබන කාර්යයන් සඳහා සභාවේ/නගරාධිපතිවරයාගේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය. තව ද, එකී කාර්යයන් සභාවේ පරිපාලන හා සංවර්ධන කාර්යයන්ට අදාළ විය යුතු ය.

06. ගමන් වියදම නගරාධිපතිවරයා සම්බන්ධයෙන් වන විටෙක ගමන් වියදම් ගෙවීමේ දී සිදුකරනු ලබන කාර්යය මහ නගර සභා ආඥාපනතින් හෝ සභාවේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය.

07. මහ නගර සභා නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු හෝ සභිකයෙකු ගමන් වියදම් ඉල්ලුම් කිරීමේ දී රජයේ මුදල් රෙගුලාසින්හි සඳහන් පොදු ආකෘති පත්‍ර 161 ට අනුව ඉල්ලුම් කළ යුතු ය. සියලුම ගමන් වියදම් ගෙවීමට පෙර සභා සම්මුතියක් මගින් අනුමැතිය ලබා ගත යුතු ය.

08. මහ නගර සභාවක නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභිකයින් සඳහා ප්‍රතිපූර්ණය කරනු ලබන ගමන් වියදම් සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

11-122/1

---

**දකුණු පළාතේ පළාත් සභාව**

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193(2) (උ) වැනි උප වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද නගර සභා සභාපති, උප සභාපති, හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 10 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

රීති

01. මෙම රීති නගර සභාවේ සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයින්ට ගමන් වියදම් ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. නගර සභාවක සභාපතිවරයෙකුට, උප සභාපතිවරයෙකුට හෝ සභිකයෙකුට සභාව මගින් පවරනු ලබන රාජකාරි කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූරණය කිරීමක් වශයෙන් පහත සඳහන් පරිදි කිලෝ මීටරයකට ගාස්තුවක් ගෙවනු ලැබිය හැකිය.

| | | |
|---|---|---|
| (i) | මෝටර් රථයක්/ත්‍රිරෝද රථයක් සඳහා කිලෝ මීටරයකට | රු. 10.00 |
| (ii) | යතුරු පැදියක් සඳහා කිලෝ මීටරයකට | රු. 4.00 |
| (iii) | පොදු වාහන සඳහා වන අවස්ථාවන්හි දී සත්‍ය වශයෙන් ඒ සඳහා ගෙවනු ලැබූ මුදල | |

03. රාජකාරි කාර්යයන් සඳහා යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම් පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය සේ සලකා කටයුතු කළ හැකිය.

අදාළ මෝටර් රථයේ /ත්‍රි රෝද රථයේ හෝ යතුරු පැදියේ,

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රි රෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගෙවනු ලබන ගමන් වියදම්වල එකතුව සභාපතිවරයෙකු/උප සභාපතිවරයකු හෝ සභිකයකු සඳහා මසකට රු. 3,000.00ක උපරිමයකට යටත් විය යුතු ය.

05. ඉහත පරිදි ගමන් වියදම් ගෙවීමේ දී සිදු කරනු ලබන කාර්යයන් සඳහා සභාවේ/සභාපතිවරයාගේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය. තව ද, එකී කාර්යයන් සභාවේ පරිපාලන හා සංවර්ධන කාර්යයන්ට අදාළ විය යුතු ය.

06. ගමන් වියදම් සභාපතිවරයා සම්බන්ධයෙන් වන විටෙක ගමන් වියදම් ගෙවීමේ දී සිදුකරනු ලබන කාර්යය නගර සභා ආඥා පනතින් හෝ සභාවේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය.

07. නගර සභා සභාපතිවරයකු, උප සභාපතිවරයකු හෝ සභිකයකු ගමන් වියදම් ඉල්ලුම් කිරීමේ දී රජයේ මුදල් රෙගුලාසින්හි සඳහන් පොදු ආකෘති පත්‍ර 161 ට අනුව ඉල්ලුම් කළ යුතු ය. සියලුම ගමන් වියදම් ගෙවීමට පෙර සභා සම්මුතියක් මගින් අනුමැතියක් ලබා ගත යුතු ය.

08. නගර සභාවක සභාපති, උප සභාපති, සභිකයින් සඳහා ප්‍රතිපූර්ණය කරනු ලබන ගමන් වියදම් සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

11-122/2

---

**දකුණු පළාතේ පළාත් සභාව**

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඥ්ඥා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති, හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඥ්ඥා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 10 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

රීති

01. මෙම රීති ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා සභිකයින්ට ගමන් වියදම් ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට, උප සභාපතිවරයෙකුට හෝ සභිකයෙකුට සභාව මගින් පවරනු ලබන රාජකාරි කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් පහත සඳහන් පරිදි කිලෝ මීටරයකට ගාස්තුවක් ගෙවනු ලැබිය හැකිය.

(i) මෝටර් රථයක්/ත්‍රීරෝද රථයක් සඳහා කිලෝ මීටරයකට රු. 10.00
(ii) යතුරු පැදියක් සඳහා කිලෝ මීටරයකට රු. 4.00
(iii) පොදු වාහන සඳහා වන අවස්ථාවන්හි දී සත්‍ය වශයෙන් ඒ සඳහා ගෙවනු ලැබූ මුදල

03. රාජකාරි කාර්යන් සඳහා යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රී රෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම් පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රී රෝද රථය හෝ යතුරු පැදිය සේ සලකා කටයුතු කළ හැකිය.

අදාළ මෝටර් රථයේ /ත්‍රී රෝද රථයේ හෝ යතුරු පැදියේ,

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රී රෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගෙවනු ලබන ගමන් වියදම්වල එකතුව සභාපතිවරයකු, උප සභාපතිවරයකු හෝ සභිකයකු සඳහා මසකට රු. 3,000.00ක උපරිමයකට යටත් විය යුතු ය.

05. ඉහත පරිදි ගමන් වියදම් ගෙවීමේ දී සිදු කරනු ලබන කාර්යයන් සඳහා සභාවේ/සභාපතිවරයාගේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය. තව ද, එකී කාර්යයන් සභාවේ පරිපාලන හා සංවර්ධන කාර්යයන්ට අදාළ විය යුතු ය.

06. ගමන් වියදම සභාපතිවරයා සම්බන්ධයෙන් වන විටෙක ගමන් වියදම් ගෙවීමේ දී සිදුකරනු ලබන කාර්යය ප්‍රාදේශීය සභා පනතින් හෝ සභාවේ තීරණයක් මගින් පවරනු ලැබූ කාර්යයන් විය යුතු ය.

07. ප්‍රාදේශීය සභා සභාපතිවරයකු, උප සභාපතිවරයකු හෝ සභිකයකු ගමන් වියදම් ඉල්ලුම් කිරීමේ දී රජයේ මුදල් රෙගුලාසින්හි සඳහන් පොදු ආකෘති පත්‍ර 161 ට අනුව ඉල්ලුම් කළ යුතු ය. සියලුම ගමන් වියදම් ගෙවීමට පෙර සභා සම්මුතියක් මගින් අනුමැතියක් ලබා ගත යුතු ය.

08. ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති, සභිකයින් සඳහා ප්‍රතිපූර්ණය කරනු ලබන ගමන් වියදම් සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

11-122/3

---

සංශෝධනයයි

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලදුව අංක 1413/15 දරන 2005 ඔක්තෝබර් මස 05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ පළ කරන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති, සහ සභිකයින් සඳහා වන දීමනාවලට අදාළ රීතිවල 3(1) ජේදයේ සඳහන් 'මහ නගර සභා' යන වචන වෙනුවට 'ප්‍රාදේශීය සභා' යන වචන ආදේශ කිරීමෙන් එකී ජේදය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3 (1) පහත සඳහන් අවස්ථාවන්හි දී ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු උපසභාපතිවරයෙකු හෝ සභිකයෙකු යථෝක්ත දීමනා සම්බන්ධයෙන් හිමිකම් නොලබයි.

ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.
දකුණු පළාත.

2012 සැප්තැම්බර් මස 28 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවාහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

11-159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.